# ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

**නො. 100, නවම් මාවත, කොළඹ 02.**

# ඇබෑර්තු

## සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන)

පහත සඳහන් තනතුරු සඳහා ප්‍රතිඵලවලට අසාමාන්‍ය ඒකාග්‍රතාවය සහ දක්ෂතාව සහිත ප්‍රතිඵල කෙරෙහි නැඹුරු වූ ස්වයං උද්යෝගී පුද්ගලයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන)** HM **1-1**

**රැකියා විස්තරය**

අ) පරිපාලන කටයුතු පහසුවෙන් ඉටුකරලීම පිණිස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) වෙත සහාය ලබාදීම.

ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පරිපාලන උප කොට්ඨාසයන්හි කළමනාකරුවන් සමග සම්බන්ධීකරණය කිරීම.

ඇ) නව පරිපාලන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි යෝජනා කිරීම.

ඈ) පරිපාලන කළමනාකරුවන් වෙත අවශ්‍ය උපදෙස් සන්නිවේදනය කිරීම.

ඉ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) විසින් පවරනු ලබන වෙනත් රාජකාරී ඉටුකිරීම.

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත්, වාණිජ්‍යය, ගිණුම්කරණය, සැපයුම්දාමය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් **සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය. **සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

### පොදු කොන්දේසි :

- **වයස :** අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
- **වෙනත් :** සෑම අයදුම්කරුවකුම
  i. ශ්‍රී ලාංකික පුරවැසියකු.
  ii. තනතුරට අදාළ රාජකාරී මැනවින් ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍යතාවය සහිත
  iii. විශිෂ්ට චරිතයකින් හෙබි අය විය යුතුය.
- **වැටුප් පරිමාණය :**
  රු. 80,295/- (2,270X15) රු. 114,345/-
  ඉහත තනතුර සඳහා ආරම්භක වැටුප් තලය රු. 80,295/- වේ.
  රු. 50,000/- ක ප්‍රවාහන දීමනාව.
  ඉන්ධන දීමනාව රාජ්‍ය පරි. චක්‍රලේඛ 05/2016 පරිදිය.
  රු. 7,800/- ක ජීවන වියදම් දීමනාව.
- **අයදුම් කිරීමේ ක්‍රියාපිළිවෙළ :**
  අයදුම්කරුවන් තම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සියලුම සහතිකවල පිටපත්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක සමග සම්පූර්ණ ජීව-දත්ත ඇතුළත් අයදුම්පත් 2021 මැයි 10 වැනිදට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දෙපාර්තමේන්තු / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය සංස්ථා / සම්පූර්ණයෙන්ම රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.


**දුරකථන : 011-2422341 / 2440880**
**ෆැක්ස් : 011-2447970**
**විද්‍යුත් තැපෑල : lankagen@sltnet.lk**
**වෙබ් අඩවිය : www.stc.lk**

**සභාපති,**
**සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව,**
**නො. 100, නවම් මාවත, කොළඹ - 02.**